# සංක්ෂිප්තය


1950 දශකයේ සිටම පාසල්වල වෘත්තිය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බව රජය විසින් අවධාරණය කරන ලදි. එහිදී රජය මූලික වශයෙන් අපේක්ෂා කළේ මෙම වැඩසටහන් තුළින් සිසුන්ට තම අනාගත වෘත්තීන් තෝරා ගැනීම සඳහා අවශ්‍ය නිවැරදි මග පෙන්වීම් ලබාදීමයි. මෙලෙස 1950 දශකයේ සිට වර්තමානය දක්වා රජය විසින් විවිධ චක්‍රලේඛ නිකුත් කරමින් වෘත්තිය මාර්ගෝපදේශන වැඩසටහන් පාසල් තුළ ක්‍රියාත්මක කළද සිසුන් එවායින් ප්‍රයෝජන ලබාගත්තේද යන්න ගැටලුවකි. මන්ද වර්තමානය වන විටත් විවිධ වෘත්තිය ක්ෂේත්‍ර ආශ්‍රිතව රැකියා පැවතියද ඒවාට ගැළපෙන ආකාරයේ වෘත්තිය කුසලතා සහිත පුද්ගලයන් බිහි නොවීමක් දක්නට ලැබෙන බැවිනි. එබැවින් මෙම පර්යේෂණය තුළින් අනාගත වැඩ ලෝකයට අවශ්‍ය පුද්ගලයන් බිහිවීමේ කර්තව්‍යයේ මූලික පසුබිම සකස් කිරීම සඳහා පාසල් වෘත්තිය මාර්ගෝපදේශන සේවාව කෙතෙක් දුරට ඉවහල් කර ගත හැකිද යන්න විමර්ශනය කර ඇත.

මෙම පර්යේෂණය ප්‍රධාන අරමුණු හතරක් ඔස්සේ ක්‍රියාත්මක විය. එනම් සිසුන් සඳහා පාසල් ආශ්‍රිත වෘත්තිය මාර්ගෝපදේශන ක්‍රියාවලියක වැදගත්කම විමසා බැලීම, වර්තමාන පාසල්වල වෘත්තිය මාර්ගෝපදේශන ක්‍රියාවලිය සිදුවන ආකාරය සොයා බැලීම, පාසල් තුළ වෘත්තිය මග පෙන්වීම් සිදුකිරීමේදී පැන නැගී ඇති ගැටලු විමසා බැලීම සහ පාසල් වෘත්තිය මාර්ගෝපදේශන ක්‍රියාවලිය සංවර්ධනය කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම ආදිය වේ.

ඉහත දැක්වූ අරමුණු වලට අදාළව මෙම පර්යේෂණය සිදු කිරීම සඳහා පර්යේෂණ පිරිසැලසුම ලෙස සමීක්ෂණ ක්‍රමය යොදා ගන්නා ලදි. එසේම පර්යේෂණයට අදාළ නියැදිය තෝරා ගැනීමේදී සම්භාවිතා නියැදුම් ක්‍රමයක් වන ස්ථරායන නියැදුම් ක්‍රමයට අනුව පාසල් 04ක් තෝරා ගන්නා ලදි. එම පාසල්වල 12 ශ්‍රේණියේ විවිධ අංශ නියෝජනය කරමින් එම අංශවල සිටින සිසුන්ට අනුපාතිකව සිසුන් 94ක් තෝරා ගැණුනි. ඊට අමතරව උපදේශන ඒකකයභාර ගුරුවරු 04ක්, උසස්පෙළ අංශ ප්‍රධාන ගුරුවරු 16ක් සහ 12 ශ්‍රේණියේ සිසුන්ගේ දෙමාපියන් 16ක් අහඹු ලෙස තෝරා ගැණුනි. දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා භාවිතා කරන ලදි. ලබාගත් දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රමාණාත්මක සහ ගුණාත්මක විශ්ලේෂණ ක්‍රම භාවිතා කරන ලදි.

මෙම පර්යේෂණය තුළින් පාසල් වෘත්තිය මාර්ගෝපදේශන සේවාව පිළිබඳ තොරතුරු රැසක් අනාවරණය විය. එහිදී විශේෂයෙන් පාසල් වෘත්තිය මාර්ගෝපදේශන වැඩසටහන් අ.පො.ස.(උසස් පෙළ) විෂයධාරාවන් තෝරා ගැනීමේදී මෙන්ම තම හැකියාවන්ට ගැලපෙන වෘත්තිය ක්ෂේත්‍ර වෙත යොමුවීමේදී වැදගත් වන බව අනාවරණය විය. එසේම පාසල්වල උපදේශන ඒකක හරහා සිසුන්ට වෘත්තියමය වශයෙන් වැදගත් වන විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර ඒ සඳහා බාහිර සම්පත් දායකයින්ද සම්බන්ධ කරගෙන ඇත. මෙලෙස පාසල් තුළ වෘත්තිය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී විවිධ ආකාරයේ ගැටලු රැසක්ද මතු වී ඇත. ඒ අතර උපදේශන ඒකකය සමග සිසුන්ට සම්බන්ධ වීමට ඇති අවස්ථා සීමා සහිත වීම, නවීන තාක්ෂණික පහසුකම් ඒකක සතු නොවීම, වෘත්තිය

මාර්ගෝපදේශනය සම්බන්ධ පොතපත පරිශීලනයට සිසුන් යොමු නොවීම, උපදේශන ඒකකය භාර ගුරුවරුයාට වෙනත් රාජකාරී පැවරීම නිසා වෘත්තිය උපදේශනය ලබාදීමට ඇති අවස්ථා සීමාසහිත වීම, වෘත්තිය මාර්ගෝපදේශන වැඩසටහන් විධිමත් පරිදි අධීක්ෂණයට ලක් නොවීම ආදී ගැටලු සුවිශේෂී විය.

ඉහත සඳහන් කර ඇති පර්යේෂණ අනාවරණ මත පාසල් වෘත්තිය මාර්ගෝපදේශන සේවාව තව දුරටත් ශක්තිමත් කිරීම සඳහා යෝජනා කිපයක්ද ඉදිරිපත් කර ඇත. ඒ අතර වෘත්තිය මාර්ගෝපදේශන සේවාව විධිමත් අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා ගැළපෙන උපදේශනය සහ වෘත්තිය මාර්ගෝපදේශනය පිළිබඳ පුහුණු ගුරුවරයෙකු යෙදවීම, ක්‍රියාත්මක කරන වැඩසටහන් නිසි අධීක්ෂණයකට ලක් කිරීම, පාසලේ උපදේශන ඒකකයට අවශ්‍ය නවීන තාක්ෂණික උපකරණ ලබාදීම, සිසුන්ට වෘත්තිය ලෝකය සම්බන්ධව පවතින ගැටලු සහ අවශ්‍ය තොරතුරු වෘත්තිය ක්ෂේත්‍ර සම්බන්ධ නිපුණතා සහ කුසලතා සහිත පුද්ගලයන් ගෙන්වා සාකච්ඡා කරවීම ආදී යෝජනා සුවිශේෂී වේ.